PR/2019/ 34/S

ජපන් ජනතාවගෙනි
ஜப்பானிய மக்களிடமிருந்து
From the People of Japan

**ජපන් තානාපති කාර්යාලය**

නො. 20, ශ්‍රීමත් ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
දුරකථනය (+94-11-2693831~3, ෆැක්ස් (+94-11-2698629)
ඊමේල්: cultujpn@co.mofa.go.jp

**පුවත්පත් නිවේදනය**

2019 නොවැම්බර් මස 28 වන දින

**මන්නාරම හා වව්නියා දිස්ත්‍රික්ක වල බිම්බෝම්බ ඉවත් කිරීමේ මානුෂීය මෙහෙයුමට ජපානයෙන් සහයෝගය**

ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ක්‍රියාත්මක වන බිම්බෝම්බ ඉවත් කිරීමේ මානුෂීය මෙහෙයුම සඳහා, ජපන් රජය, ඇමරිකානු ඩොලර් 635,420 ක (දළ වශයෙන් රුපියල් මිලියන 110 ක) ආධාර මුදලක්, මයින්ස් ඇඩ්වයිසරි ගෲප් හෙවත් මැග් (Mines Advisory Group - MAG) සංවිධානයට ලබා දීමට තීරණය කර ඇත. මෙම ආධාර ගිවිසුමට කොළඹ පිහිටි ජපන් තානාපති කාර්යාලයේදී 2019 නොවැම්බර් මස 28 වන දින ජපන් තානාපති ගරු සුගියම අකිරා මැතිතුමා සහ මැග් (MAG) සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිත වැලන්ටිනා ස්ට්වානෙලෝ මහත්මිය අත්සන් තැබිය.

මෙම ව්‍යාපෘතිය මගින් අවතැන් වූ උතුරේ ජනතාවට නැවත පදිංචි වී තම ජීවිකාවන් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා රජය මගින් ක්‍රියාත්මක වන බිම්බෝම්බ වලින් තොර ආරක්ෂිත ප්‍රදේශ ඇති කිරීමේ වැඩපිළිවෙල තවදුරටත් ශක්තිමත් කෙරෙනු ඇත.

වර්ෂ 2003 සිට ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි බිම්බෝම්බ ඉවත් කිරීමේ කාර්යයන් සඳහා ජපානය තම ආධාර සැපයීමේ වැඩ සටහන යටතේ බිම් මට්ටමේ මානව ආරක්ෂණය සඳහා වන ආධාර ව්‍යාපෘතිය (GGP) මගින් ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 36 ක් ලබා දී ඇත. වර්ෂ 2020 වන විට ශ්‍රී ලංකාව බිම්බෝම්බ බලපෑමෙන් නිදහස් කිරීමේ ශ්‍රී ලංකා රජයේ අරමුණට ළඟා වීමට ජපානය ඉමහත් දායකත්වයක් මෙමගින් ලබා දී ඇත.

තවද ජපන් රජය විසින් ශ්‍රී ලංකාවේ අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීමටත් ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතු නැවත ආරම්භ කිරීමටත් එමෙන්ම වෙනත් ජීවනෝපායන් ආරම්භ කිරීම සඳහාත්, මේ හා සමාන තවත් ආධාර ප්‍රදානයන් දෙකක් පසුගිය ඔක්තොම්බර් මාසයේ දී ලබාදෙන ලද අතර, මෙය එම කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීමට විශාල පිටුවහලක් වනු ඇත.

මෙම ආධාර මුදල පිළිබඳව අදහස් දක්වමින් වැලන්ටිනා ස්ටිවානෙලෝ මහත්මිය ප්‍රකාශ කර සිටියේ "ශ්‍රී ලංකාවේ හා ලොව පුරා බිම්බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන් සඳහා ආධාර කිරීම සම්බන්ධයෙන් අභිමානයට පාත්‍ර වූ ජපන් රජයෙන් ලබාදෙන මෙම ආධර මුදල අප ඉතා ගෞරවයෙන් පිළිගන්නා බවත්, පසුගිය පස් වසර තුල පමණක් මැග් ශ්‍රී ලංකා සංවිධානයත් ජපාන රජයත් අතර හවුල්කාරිත්වය හරහා බිම්බෝම්බ 12,000කට අධික ප්‍රමාණයක් ඉවත් කර විනාශ කිරීමට හැකි වී තිබෙන බවත්ය. මෙමගින් මන්නාරම, මුලතිවු සහ වවුනියා දිස්ත්‍රික්කයේ නැවත පදිංචි වීම සඳහා දහස් ගණනින් පැමිණෙන පුද්ගලයන්ගේ ජීවිත හා ජීවිකාවන් ගොඩනැංවීමට හැකි වී තිබෙන බවත්ය. ජපන් ජනතාවගේ ආධාර හමුවේ තවදුරටත් ජීවිත සුරැකෙන අතර එයට අමතරව ශ්‍රී ලංකාවේ විශාල වශයෙන් බිම්බෝම්බ අවදානමට ලක්ව ඇති ඉතා දිළිඳු ප්‍රජාවන් සඳහා ජීවනෝපායයන් සංවර්ධනයට සහාය වීමෙන් අනාගතය ගොඩනැගීමක් ද සිදුවන අතර, වර්ෂ 2020 වන විට ශ්‍රී ලංකාව බිම්බෝම්බ බලපෑමෙන් නිදහස් කිරීමේ අරමුණ කරා ලඟා වීමට මැග් ශ්‍රී ලංකා සංවිධානය බලාපොරොත්තු වනවා" යන්නයි.

වැඩි විස්තර සඳහා කරුණාකර අමතන්න
ජපන් තානාපති කාර්යාලයේ සංවර්ධන සහයෝගිතා අංශය
දුරකථන අංක 011-2693831 දිගුව 225
ඊමේල් : cultujpn@co.mofa.go.jp